# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2460/38 - 2025 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2025.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ හම්බන්තොට මහා නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන **හම්බන්තොට මහා නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති** හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ හම්බන්තොට මහා නගර සභාවේ 8 ආලෝකපුර කොට්ඨාසයට තේරී පත්වූ හේරත් මුදියන්සේලාගේ ආසිරි ඉන්දික හේරත් අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම හම්බන්තොට මහා නගර සභාවේ 8 ආලෝකපුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වන්නි ආරච්චි කංකානම්ගේ චින්තක ප්‍රියදර්ශන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

හම්බන්තොට මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරී විතානගේ දොන් ජයාන් ලක්මාල් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් වන්නි ආරච්චි කංකානම්ගේ චින්තක ප්‍රියදර්ශන, හම්බන්තොට මහා නගර සභාවේ 8 ආලෝකපුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**වී. ඩී. ජේ. ලක්මාල්,**
තේරීම්භාර නිලධාරී,
**හම්බන්තොට මහා නගර සභාව.**

2025 ඔක්තෝබර් මස 31 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
**හම්බන්තොට.**

EOG 10 - 0296

1A - PG 7323 — 08 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*